# දුම්රිය දෙපාර්තමේන්තුවේ ජොෂ්ඨ විධායක සේවා ගණයේ අතිරේක සාමාන්‍යාධිකාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය.

වැටුප් කේත අංකය : - **SL-03-2016**

## දුම්රිය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයේ අතිරේක සාමාන්‍යාධිකාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. **සම්බන්ධ වන ආයතන,**

1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
යොමු අංකය : GMA/SOR/2015/SL-03 දිනය : 2017.10.20

1.2 අමාත්‍යාංශය : ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
යොමු අංකය : MT/03/03/02-Vol-1 දිනය :2017.11.27

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :
යොමු අංකය : DMS/F2/DR/01 දිනය : 2013.04.09

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-2/REC/02/1292 දිනය :2017.06.27

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/02/43/SR-II දිනය :2017.07.31

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/04-01-43/01/2018 දිනය :2018.09.11

**02.** **පත්කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03.** **සේවා ගණය පිළිබඳ විස්තර,**

3.1 සේවා ගණය : ජ්‍යෙෂ්ඨ විධායක

3.2 ශ්‍රේණිය : විශේෂ

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : අභිමතානුසාරී බලය හිමිවන්නා වූද, ප්‍රතිපත්ති සම්පාදනය, විධානය හා තීරණ ගැනීමේ කාර්යයට සෘජුවම ඇතුළත් වන්නා වූද, කාර්යභාරයක් පැවරෙණ සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවා අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතා පදනම් කොට ගෙන දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** **තනතුරෙහි/තනතුරුවල ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)

05. වැටුප් :

5.1 වැටුප් කේත් අංකය : SL 03 – 2016

5.2 මාසික වැටුප් පරිමාණය : රු. 88,000-12x2,700-120,400 /-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය ( රු. ) |
|---|---|---|
| විශේෂ | පියවර 1 | 88,000 /- |

**2016 සිට 2020 දක්වා වැටුප් ගෙවිය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 උපලේඛන II හි සඳහන් පරිදි විය යුතුය**

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) | විශේෂ | 01 | i. දුම්රිය ප්‍රවාහනය හා වාණිජ කාර්යයන් ඉටු කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ සියළුම උප දෙපාර්තමේන්තුවල සහය ලබා ගැනීම හා සම්බන්ධීකරනය පවත්වාගෙන යාම.<br>ii. ප්‍රවාහන, වාණිජ , සැලසුම් හා පිරිවැය කටයුතු සම්බන්ධ අධීක්ෂන ප්‍රධානියා ලෙස කටයුතු කිරීම<br>iii. ප්‍රවාහන,වාණිජ,සැලසුම් හා පිරිවැය කාර්යයන්හිදි දුම්රිය සාමාන්‍යාධිකාරිට මග පෙන්වීම හා අවශ්‍ය සහයෝගය ලබා දීම.<br>iv. ප්‍රවාහන,වාණිජ,සැලසුම් කටයුතු පිළිබඳව ප්‍රතිපත්ති සකස් කිරීම සහ දුම්රිය සාමාන්‍යාධිකාරීට සහයවීම.<br>v. ප්‍රවාහන හා ධාවනබල උප දෙපාර්තමේන්තුවල දුම්රිය මෙහෙයුම් කටයුතුවලට අදාල විනය කාර්යයන් වලදී විනය කරුණු අවසන් කිරීම.<br>vi. දෙපාර්තමේන්තු කාර්යක්ෂමතාව අධීක්ෂනය කිරීම හා වියදම් පාලනය කිරීම.<br>vii. රට තුළ ප්‍රවාහන තත්වය අවධානයට ලක්කර දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඉටු කල හැකි කාර්යයන් පිළිබඳව දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත යෝජනා ඉදිරිපත් කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 01

## 07. බඳවා ගැනීමේ ක්‍රමය.

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ. |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ. |

**7.2 විවෘත බඳවා ගැනීම** : අදාළ නොවේ.

**7.3 සීමිත බඳවා ගැනීම :**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය: විශේෂ

7.3.2 සුදුසුකම්:

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : ඕනෑම ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද : ප්‍රවාහන හා වාණිජ උප දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට දුම්රිය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයට අයත් තනතුරක වසර 18කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සටහන:

වාණිජ උප දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු මෙම තනතුරට ඉල්ලුම් කරන්නේ නම් එම නිලධාරියා ඉහත සුදුසුකම් වලට අමතරව ප්‍රවාහන උප දෙපාර්තමේන්තුවේ සහකාර අධිකාරී/ නියෝජ්‍ය අධිකාරී මට්ටමේ තනතුරක දුම්රිය මෙහෙයුම් කටයුතු පිළිබඳව වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

7.3.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

I. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

III. පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත 7.3.2 සිට 7.3.3 දක්වා සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස : අදාල නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පටිපාටියට අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ඉන් ඉහළම ලකුණු ලබා ගත් නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) තනතුරට පත් කරනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නැත

7.3.4.4 යෝග්‍යතා ඇගයමේ සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)/ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) යන තනතුරේ වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | 20 | අදාළ නොවේ |
| ජ්‍යෙෂ්ඨතාවය | 50 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| I. තනතුරේ රාජකාරී ව්‍යුහය.<br>II. ආරක්ෂිත කළමනාකරණය, ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඇතුළත් දුම්රිය මෙහෙයුම්<br>III. වාණිජ නීති ඇතුළත් වෙළඳපොළ කටයුතු<br>IV. දුම්රිය සේවාවන්ගේ වෙළඳපොළ කටයුතු<br>V. මානව හා මානව සම්පත් කළමනාකරනය යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි කරනු ලබන ඉදිරිපත් කිරීමක් | 25 | |
| මුළු ලකුණු | <u>100</u> | |

සටහන :

බඳවා ගනු ලබන ප්‍රථම අවස්ථාවේදී පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ජ්‍යෙෂ්ඨතාවයට 60 ක් හා කුසලතාවයට 40 ක් ලෙස ලකුණු ලබා දෙනු ලැබේ.

7.3.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම හා වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**7.4** **කුසලතා පදනම මත බඳවා ගැනීම** : අදාළ නොවේ.

**08. කාර්යක්ෂමතා කඩඉම් :** අදාළ නොවේ

**09. භාෂා ප්‍රවීණතාව : අදාළ නොවේ.**

**10. ශ්‍රේණි උසස් කිරීම් :** අදාළ නැත

**11. තනතුරුවලට පත්කිරීම :** අදාළ නොවේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :** අදාළ නැත

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිභාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

I. "සක්‍රීය සේවා කාලය" වැටුප් රහිත නිවාඩු කාලයක් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් , නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ .

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :** අදාළ නැත

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක : 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

**16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

**17. අන්තර් කාලීන විධිවිධාන :** අදාළ නොවේ.

සකස් කළේ : අත්සන : ..........[signature]..........

නම : ..........එස්. ඒ. ආර්. ඩී. ජයසේකර
තනතුර : ..........පරිපාලන නිලධාරි (පත්වීම්) ආවරණ
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
දිනය : ..........2018.10.1.. මරදාන, කොළඹ 10.

පරීක්ෂා කළේ : ..........[signature]..........
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නම : ..........ජ. ගමගේ
අතිරේක සාමාන්‍යාධිකාරි (පරිපාලන)
තනතුර : ..........ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.
දිනය : ..........2018.10.19..........

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........[signature]..........
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ..........එම්. ජේ. ඩී. ප්‍රනාන්දු
දුම්රිය සාමාන්‍යාධිකාරී
තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
කොළඹ 10.
නිල මුද්‍රාව : ..........

දිනය : ..........19/10/18..........

---

යොමු අංකය : ..........MT/03/03/02-V01-I

2018.09.11 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දුම්රිය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ශ්‍රේණියේ අතිරේක සාමාන්‍යාධිකාරී තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ..........[signature]..........

නම : ..........

ලේකම්

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

ජ්. එස්. විතානගේ
ලේකම්
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
7 වන මහල, සෙත්සිරිපාය (අදියර II)
බත්තරමුල්ල.

දිනය : ..........2018.11.07..........

නිල මුද්‍රාව : ..........

---

යොමු අංකය : ..........PSC/EST/04-01-43/01/2018

..........දුම්රිය දෙපාර්තමේන්තුවේ.......... හි ජ්‍යෙෂ්ඨ විධායක සේවා ශ්‍රේණියේ අතිරේක සාමාන්‍යාධිකාරී තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය ..........2018.09.11.......... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........[signature]..........

නම : ..........එම්. ඒ. බී. දයා සෙනරත්..........

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : ..........2019/01/20..........

නිල මුද්‍රාව : ..........එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.